# දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ ජන සෞඛ්‍ය හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සේවය සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සෞඛ්‍ය කම්කරුවන්ගේ සේවය ලබා ගැනීම

- දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ජන සෞඛ්‍ය හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය කම්කරු කාර්යයන් සඳහා <u>සේවා අවශ්‍යතාවය පවතින දින වලදී පමණක්</u> සේවයට කැඳවීමට යටත්ව, මාස 06ක කාලයකට ගිවිසුම්ගතව, කම්කරුවන් ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ලබා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

<u>තනතුරට අදාල කාර්යයන් පහතින් දැක්වේ.</u>

- මාර්ග ඇමදීම, දෙපස කාණු පිරිසිදු කිරීම, විධිමත් ලෙස කසල බැහැර කිරීම, කාණු දෙපස වල්පැල ඉවත් කිරීම, නිවෙස් වලින් හා ආයතන වලින් නිසි පරිදි කසල එක්රැස් කිරීම, නිසි පරිදි කසල ප්‍රවාහනය හා අවසාන බැහැරලීමට අදාල කාර්යයන්, අධීක්ෂණ නිලධාරි විසින් නියම කරනු ලබන කාර්යයන් ඉටු කිරීම, ආයතනික අවශ්‍යතාවය මත දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරී...
- මෙම සියළු කාර්යයන් අසීරු සහ වෙහෙසකර කාර්යයන් වන හෙයින් පිරිමි අයදුම්කරුවන් වඩාත් සුදුසු වේ.

මේ සමඟ ඉදිරිපත් කර ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඔබ විසින් සකස් කරනු ලබන අයදුම්පතක් ඉදිරිපත් කළයුතු අතර, අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි **"ශ්‍රම මිලදී ගැනීම්- සෞඛ්‍ය කම්කරු"** ලෙස සඳහන් කර **<u>2024.08.16</u>** දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ගාලුපාර, දෙහිවල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (අදාල අයදුම් පත්‍රය <u>www.dmmc.lk</u> යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක)

1. තනතුර - **සෞඛ්‍ය කම්කරු 50** (ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත)
2. දීමනාව - වැඩකරන එක් දිනක් සඳහා **රු.2,700/- කි.**

3. සුදුසුකම් -

I. තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

II. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

III. වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර 55 ට නොවැඩි විය යුතුයි.

IV. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03ක් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කල යුතුය. (දෙහිවල ගල්කිස්ස මහ නගර සභා බලප්‍රදේශය තුල පදිංචි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. ග්‍රාම නිලධාරී සහතිකයක් මඟින් පදිංචිය සනාථ කල යුතුය.)

V. අයදුම්කරු අපරාධ ක්‍රියාවන්ට සම්බන්ධ වී නොමැති බව සනාථ කිරීමට, පදිංචියට අදාල පොලිස් ස්ථානයෙන් නිකුත් කල පොලිස් සහතිකයක් ඉදිරිපත් කළයුතුයි.

4. බඳවා ගැනීමේ ක්‍රමය - <u>සුදුසුකම්ලත් අයදුම්කරුවන් පහත කොන්දේසිවලට යටත්ව සේවය සඳහා යොදවා ගනු ලැබේ.</u>

I. නියමිත දිනට පෙර අයදුම්පත් ඉදිරිපත් කරන සියළුම අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරන අතර, එහිදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මෙම ක්ෂේත්‍රයට අදාලව වාචිකව ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්නාවලියක් සඳහා ලබා දෙන පිළිතුරු අනුව වැඩිම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් සහ අංක 03 යටතේ දක්වා ඇති සුදුසුකම් සියල්ල සපුරා ඇති අයදුම්කරුවන් තනතුරට අදාලව ප්‍රායෝගික පරීක්ෂණයක් සඳහා යොමු කරනු ලැබේ.

II. එම ප්‍රායෝගික පරීක්ෂණයට අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සෞඛ්‍ය කම්කරුවන් ලෙස ලියාපදිංචි කරනු ලැබේ.

III. ඔවුන් අතුරින් අවශ්‍ය කම්කරුවන් අවශ්‍යතාවය පවතින දින වලදී පමණක් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සමඟ එළඹෙන ගිවිසුමකට යටත්ව සේවය සඳහා කැඳවනු ලැබේ.

IV. ගිවිසුමට එළඹීමට පෙර, දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් නියම කරනු ලැබුවහොත්, ඇප කොන්දේසි වලට යටත්ව රු.5,000/-ක ඇපයක් තැබීමට ඔබ බැඳී සිටිය යුතුය.

V. දිනකට අවම පැය 08ක කාලයක් සේවයේ යෙදිය යුතුය.

VI. පූර්ණ කාලීනව රාජකාරීන් හි නියැලිය යුතුය.

VII. මසක් තුල ඔබ වැඩ කරන දින ගණන සඳහා අදාල දීමනාව ඊළඟ මස 10 වන දිනට පෙර ගෙවීම් කරනු ලබයි.

VIII. සේවයේ අවශ්‍යතාවය මත සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දිනවල කැඳවීම් කරනු ලැබුවහොත්, සේවය කිරීමට ඔබ බැඳී සිටිය යුතුය.

IX. <u>සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් සහතික ඉදිරිපත් කළ යුතුය.</u>

* ග්‍රාම නිලධාරි සහතිකය (මුල් පිටපත)
* උප්පැන්න සහතිකය (මුල් පිටපත සහ සහතික කල පිටපත)
* ජාතික හැඳුනුම්පත (මුල් පිටපත සහ සහතික කල පිටපත)
* පදිංචි වසමට අදාල පොලිස් ස්ථානය විසින් නිකුත් කරන ලද පොලිස් සහතිකය (මුල් පිටපත)

5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2024.08.16** වේ. එදිනට ඉහත කී සියලුම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරා තිබිය යුතුයි.
6. අදාල සේවා ලබා ගැනීම හෝ නොගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය මත දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ.

**එම්.එම්.සී.කේ.කේ.මාන්නප්පෙරුම**
**නාගරික කොමසාරිස් සහ,**
**බලතල, කාර්යය, කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී**
**දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව, ගාලු පාර, දෙහිවල.**

## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ
## සෞඛ්‍ය කම්කරු තනතුර සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සේවයේ යෙදවීමේ
## අයදුම්පත්‍රය

### 1. ජීව දත්ත තොරතුරු :

1.1. මුලකුරු සමග නම (උදා- ඒ.බී.සී.සිල්වා) :

..............................................................................................................................

1.2. සම්පූර්ණ නම :

..............................................................................................................................

..............................................................................................................................

1.3. ස්ථිර ලිපිනය :

..............................................................................................................................

..............................................................................................................................

1.4. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

1.5. දුරකථන අංකය : ..............................................................................................

1.6. උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

1.7. **2024.08.16** දිනට වයස : අවුරුදු ........................ මාස ........................ දින ...........................

### 2. සුදුසුකම් හා පළපුරුද්ද

..............................................................................................................................

..............................................................................................................................

..............................................................................................................................

**අයදුම්කරුගේ සහතිකය :**

මෙම ඉල්ලුම් පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම රාජකාරි සඳහා යොදවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා ඒ සඳහා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, රාජකාරි සඳහා යෙදවීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් හෝ ඇප මුදල් ආපසු නොගෙවා ගිවිසුම අවසන් කිරීමට යටත් වන බවත් මා දනිමි.

......................................... ..................................................

දිනය අයදුම්කරුගේ අත්සන

සැ.යු. :- නිවැරදිව සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් අදාළ සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.